)වීඥීම් ඥවීලූ!දි ටිචිරිමීවී
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

7 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 2 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 25 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 ශිථිලකරණය යන්නෙන් අදහස් කරන්නේ,
(1) සතර අභිනය මගින් රූපණය කිරීමයි. (2) ශරීරය සැහැල්ලු කිරීමයි.
(3) රංගනයට පෙර මානසික සූදානමයි. (4) ශරීරය සිසිල් කර ගැනීමයි.

02 නාට්‍ය ධර්මී රංග ශෛලියට අනුව නිර්මාණය වූ නාට්‍යයකි
(1) ටිකිරි මැණිකේ (2) නරිබෑණා
(3) පුංචි අපට දූන් තේරෙයි (4) සිංහබාහු

03 අංගරචනය, රංග වස්ත්‍රාභරණ මගින් කිසියම් චරිතයකට ප්‍රවිශ්ට වීම,
(1) බාහිර සමාරෝපයයි. (2) වෙස්වලා ගැනීමයි.
(3) අභ්‍යන්තර සමාරෝපයයි. (4) ආහාර්ය අභිනයයි.

04 ආහාර්ය අභිනයට අයත් වනුයේ මින් කවරක් ද?
(1) නාට්‍ය පෙළ, අංග රචනය, සංගීතය
(2) සංගීතය, නාට්‍යෝපකරණ, ආලෝකකරණය
(3) අංගරචනය, රංග භාණ්ඩ, නාට්‍යමය සංවාද
(4) පසුතල නිර්මාණ, රංග වස්ත්‍ර, නළු නිළියන්

05 ළමා නාට්‍යයක දැකිය හැකි ලක්ෂණයකි
(1) අයහපත් චරිත සිය දුබලතා පිළිනොගැනීම.
(2) වාචික අභිනය අඩුවෙන් භාවිතා කිරීම.
(3) වේදිකාව මත භයංකාර සිදුවීම් මවාපෑම.
(4) විචිත්‍රවත් ප්‍රේක්ෂාවකින් යුක්ත වීම.

06 නාට්‍ය කලාව හා ටෙලිනාට්‍ය අතර දැකිය හැකි ප්‍රබල වෙනස්කමකි
(1) සංවාද භාවිතය (2) පිටපතකින් යුක්තවීම
(3) සජීවී බව (4) අංගරචනය යොදාගැනීම

07 කාටූන් චිත්‍රපට පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කවරේ ද?
(1) නළු නිළියන් උපයෝගී කොටගෙන රූගත කරයි.
(2) කාටූන් චිත්‍ර සටහන් මගින් රූගත කරයි.
(3) සජීවීව ඉදිරිපත් කරයි.
(4) චිත්‍ර ප්‍රදර්ශන වලින් ලබාගනියි.

08 එමිල්, මිලිපිලි, ෂොනලොක් ..... යන චරිත අඩංගු ළමා නාට්‍ය වනුයේ,
(1) පුංචි අපට දූන් තේරෙයි (2) පොල්ගෙඩියට ජරමරේ
(3) ටිකිරි මැණිකේ (4) නෙළුම් කුමාරි

09 ශ්‍රී ලාංකේය කාටූන් කලාවට සුවිශේෂී මෙහෙයක් කරන ලද නිර්මාණකරුවා
(1) හෙන්රි ජනසේන මහතා ය. (2) සෝමලතා සුබසිංහ මහත්මිය ය.
(3) පාලිත ලොකුපෝතාන ගමගේ මහතා ය. (4) ටයිටස් තොටවත්ත මහතා ය.

10 ''ටිකිරි මැණිකේ'' ළමා නාට්‍යයේ මුල් රචකයා වනුයේ,
(1) ස්ටොකර්ලොක් උන්ඩි මිලිපිලි ය. (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ය.
(3) සෝමලතා සුභසිංහ ය. (4) එදිරිවීර සරච්චන්ද්‍ර ය.

11 වේදිකාව මත මොහොතින් මොහොත මැවෙන දර්ශන
(1) රංග වින්‍යාසය ලෙස හඳුන්වයි. (2) ප්‍රේක්ෂාව ලෙස හඳුන්වයි.
(3) කථා වින්‍යාසය ලෙස හඳුන්වයි. (4) තත්වානුරූපී මායාව ලෙස හඳුන්වයි.

12 නාට්‍ය නිර්මාණයක මුල, මැද, අග ගැළපීමේ පිළිවෙල
(1) කථා වින්‍යාසය යි. (2) රංග වින්‍යාසය යි.
(3) කතාන්දරය යි. (4) පෙළ රචනය යි.

13 නාට්‍ය ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ සඳහන් කොට ඇති අභිනය ගණන වනුයේ,
(1) 2 (2) 4 (3) 3 (4) 8

14 සතර අභිනය හඳුන්වාදෙන ලද්දේ,
(1) ඇරිස්ටෝටල් ය. (2) ධනංජය පඬිවරයා ය.
(3) භරතමුනිවරයා ය. (4) වෝල්ටර් මාරසිංහ ය.

15 අංගරචනය අයත් වන්නාවූ අභිනය වනුයේ,
(1) ආංගික අභිනයට ය. (2) වාචික අභිනයට ය.
(3) ආහාර්ය අභිනයට ය. (4) සාත්වික අභිනයට ය.

16 දේශාභිමානී ගීත කාණ්ඩයට අයත් වේ,
(1) සිංහල ඉතිහාස පොතේ රන් අකුරින් ලියැවුනා.... (2) ඉරෙන් ඉඳෙන් .....
(3) කොටු වැටිච්ච පුංචි සරම ...... (4) සෝබාව දේ .....

17 ඓතිහාසික කථා පුවතක් ඇතුළත් නාට්‍ය නිර්මාණයකි
(1) කුවේණි (2) කැලණි පාලම (3) නරිබෑණා (4) වෙල්ල වැහුං

18 ශ්‍රී ලංකාවට සම්බන්ධ ඓතිහාසික කථා ඇති ග්‍රන්ථයකි
(1) රසු වංශය (2) රාජ රත්නාකරය
(3) නාට්‍ය ශාස්ත්‍රය (4) සද්ධර්ම රත්නාවලිය

19 ජන ක්‍රීඩාවලට අයත් වනුයේ මින් කවරක් ද?
(1) දර්පණ අභ්‍යාස (2) ගස් දෙකේ යුද්දය
(3) තාපන අභ්‍යාස (4) ශිථිලකරණ අභ්‍යාස

20 වචන භාවිතයෙන් තොරව කිසියම් සිදුවීමක් කර පෙන්වීම
(1) අභිරූපණයයි. (2) අනුකරණයයි. (3) සමාරෝපයයි. (4) භූමිකා නිරූපණයයි.

21 ''රංග අභ්‍යාස'' වලට අයත්ය
(1) චක්ගුඩු පැනීම (2) ලේන්සු හැංගීම
(3) කොට්ට පොර ගැසීම (4) චලන

22 චිත්ත ඒකාග්‍රතාවය ලබාගැනීම සඳහා කරනු ලබන රංග අභ්‍යාසයකි
(1) දර්පණ අභ්‍යාස (2) ශ්වසන අභ්‍යාස (3) තාපන අභ්‍යාස (4) චලන අභ්‍යාස

23 බුද්ධ ගජ්ජය කියැවීමේ දී
(1) වෘත්තගන්ධි ශෛලියෙන් කියවයි. (2) රිද්මයකට කියවයි.
(3) අක්සර ශබ්ද නගා කියවයි. (4) විරිතකට අනුව කියවයි.

24 ''සිරි සංඝ බෝධි මාලිගාවේ දී...'' යන ගිතය අයත් වනුයේ
(1) රාමායණයට ය. (2) සිරිසඟබෝ නූර්තියට ය.
(3) වෙස්සන්තර නූර්තියට ය. (4) පද්මාවතී නූර්තියට ය.

(1 x 20 = 20)

25 වෙස්මුහුණු පැළඳ කරනු ලබන ගැමි නාටකයකි
(1) කෝළම් (2) සොකරි (3) නූර්ති (4) නාඩගම්

- **අංක 26 සිට 30 දක්වා වූ වාක්‍ය හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

26 ක්ෂණික නිරූපණ පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරයි. ( )
27 සමාරෝපය කොටස් දෙකකින් යුක්තයි. ( )
28 කතාන්දරයක් වේදිකාව මත පෙන්විය හැකිය. ( )
29 නාට්‍යයක් රූපණයේ දී ශරීරය හා මනස ප්‍රයෝජනවත් වේ. ( )
30 නාට්‍ය පිටපතක ප්‍රධාන චරිත පමණක් දැකිය හැකිය. ( )

(1 x 30 = 30)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණයට ල. 30 කි.**

01 ඓතිහාසික කථා පුවතක් පාදක කොටගනිමින් රූපණයට සුදුසු නාට්‍ය පෙළක් නිර්මානය කරන්න. (ල. 10)

02 (1) ''අභිනය'' යන්න පහදන්න. (ල. 05)
(2) සතර අභිනය නිදසුන් ගෙන පහදන්න. (ල. 05)

03 (1) රංග භාණ්ඩ යනුවෙන් හඳුන්වන්නේ මොනවා ද? (ල. 05)
(2) රංග භාණ්ඩ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ල. 05)

04 වේදිකා නාට්‍යයක හා රූපවාහිනී නාට්‍යයක වෙනස්කම් 5 ක් බැගින් ලියන්න. (ල. 10)

05 (1) වේදිකා නාට්‍යයක් සම්බන්ධ පහත දෑ පිළිවෙලින් ලියන්න.
(නළුවා / ප්‍රේක්ෂකයා / අධ්‍යක්ෂවරයා / නාට්‍ය පිටපත) (ල. 05)
(2) අධ්‍යක්ෂක හැරුණුවිට නාට්‍යයක් සඳහා දායක වන්නා වූ පුද්ගලයින් 4 දෙනෙකු නම් කරන්න. (ල. 05)

(10 x 4 = 40)